සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

02 S

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2570 - දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2026

(02) බුද්ධ ධර්මය හා පාලි භාෂා පරිචය

පැය තුනයි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

● මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විත වේ. අවම වශයෙන් එක් කොටසකින් **එක්** ප්‍රශ්නයක්වත් ඇතුළත් වන සේ තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

I කොටස

1. (i) නිර්මාණවාදය යනු කුමක්දැයි හඳුන්වන්න. (ලකුණු 02 යි)

(ii) ශාස්වතවාදය හා උච්ඡේදවාදය පිළිබඳ කෙටි විවරණයක් කරන්න. (ලකුණු 04 යි)

(iii) "මෙය ඇති කල්හි මෙය ඇති වේ." සහ "මෙය නැති කල්හි මෙය නැති වේ." යන ප්‍රකාශ දෙක පටිච්චසමුප්පාද න්‍යායට අනුව පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iv) අවිද්‍යාදී ධර්මයන් ප්‍රත්‍යය කොටගෙන සංසාර චක්‍රය ක්‍රියාත්මක වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 08 යි)

2. (i) ආර්ය සත්‍යයේ ප්‍රභේද කෙතෙක්දැයි දක්වා, ඒවා නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) සත්‍ය ගවේෂණයේ දී අත්හළ යුතු අන්ත දෙක හඳුන්වන්න. (ලකුණු 04 යි)

(iii) 'ඉපදීම ද දුකක්' (ජාතිපි දුක්ඛා) ලෙස සැලකෙන්නේ කවර හෙයින්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iv) ආර්ය අෂ්ටාංගික මාර්ගයට ඇතුළත් අංග නම් කොට, එහි පළමු අංගය පැහැදිලි කරන්න. (ලකුණු 08 යි)

3. (i) පහත දැක්වෙන පාලි පාඨ දෙකෙහි සරල අදහස ලියා දක්වන්න.

(අ) යදනිච්චං තං දුක්ඛං.

(ආ) න හි ජාතු ගබ්භසෙය්‍යං පුනරේති. (ලකුණු 02 යි)

(ii) 'සංඛත' හා 'අසංඛත' යන පද වෙන වෙන ම හඳුන්වන්න. (ලකුණු 04 යි)

(iii) 'අස්මිමානය' (මම වෙමි) යනු කුමක්දැයි නිදසුන් සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iv) අනිත්‍ය, දුක්ඛ හා අනාත්ම යන ධර්මතා තුන එකිනෙකට සම්බන්ධ වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 08 යි)

4. (i) බුදුදහමට අනුව අචේතනික හා සචේතනික ක්‍රියා නිර්වචනය කරන්න. (ලකුණු 02 යි)

(ii) අකුසල කායකම්ම හා අකුසල වචීකම්ම ගණයට වැටෙන ක්‍රියා කවරේදැයි පෙන්වා, ඒවා විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iii) මව් කුසක් තුළ කලලයක් වැඩීමට සම්පූර්ණ විය යුතු කරුණු පිළිබඳ බෞද්ධ ඉගැන්වීම පරීක්ෂා කරන්න. (ලකුණු 06 යි)

(iv) 'සියල්ල පූර්ව කර්මයෙන් සිදු නොවන බව' පංච නියාම ධර්ම ඇසුරෙන් තහවුරු කරන්න. (ලකුණු 08 යි)

CS Scanned with CamScanner

[2 වැනි පිටුව බලන්න.

Past Papers Wiki

II කොටස

5. (i) සමථ භාවනාව සඳහා අදාළ වන කර්මස්ථාන කොපමණ ද? (ලකුණු 02 යි)

(ii) සමථ භාවනාව හා විපස්සනා භාවනාව වෙන වෙන ම හඳුන්වන්න. (ලකුණු 04 යි)

(iii) කර්මස්ථානාචාර්යවරයකු විසින් කමටහන් දීමේ දී සලකා බැලිය යුතු පුද්ගල චරිත පිළිබඳ විවරණයක් කරන්න. (ලකුණු 06 යි)

(iv) විදර්ශනායෝගියකු රූපාදි ධර්මයන් අස්සාද, ආදීනව හා නිස්සරණ වශයෙන් බලන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 08 යි)

6. (i) 'චිත්තක්ෂණයක්' යන්නෙන් අදහස් වන්නේ කුමක්දැයි හඳුන්වන්න. (ලකුණු 02 යි)

(ii) කාමාවචර, රූපාවචර, අරූපාවචර හා ලෝකෝත්තර සිත් සංඛ්‍යාව වෙන වෙන ම දක්වන්න. (ලකුණු 04 යි)

(iii) සොතාපත්ති ඵලයට පත්වීමෙන් ප්‍රහාණය වන සංයෝජන ධර්ම කවරේදැයි විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iv) පහත දැක්වෙන අකුසල් සිත් දෙක ලෝභය මුල්කොට ඇතිවන ආකාරය වෙන වෙන ම පැහැදිලි කරන්න.

(අ) සෝමනස්සසහගත දිට්ඨිගතසම්පයුත්ත අසංඛාරික සිත

(ආ) සෝමනස්සසහගත දිට්ඨිගතවිප්පයුත්ත සසංඛාරික සිත (ලකුණු 08 යි)

7. (i) අභිධර්මයෙහි ඉගැන්වෙන රූප ධර්ම සංඛ්‍යාව කොපමණ ද? (ලකුණු 02 යි)

(ii) සතර මහාභූත රූප නම් කොට, ඒවා එකිනෙකින් අදහස් වන්නේ කුමක්දැයි දක්වන්න. (ලකුණු 04 යි)

(iii) චක්ඛුප්පසාදය හඳුන්වා, එය චක්ඛුවිඤ්ඤාණය ඉපදවීමට හේතුවන ආකාරය විවරණය කරන්න. (ලකුණු 06 යි)

(iv) නිර්වාණ මාර්ගයේ අනුක්‍රමික පියවර හතර පැහැදිලි කරන්න. (ලකුණු 08 යි)

III කොටස

8. පහත දැක්වෙන ගාථාවල සරල අදහස දක්වන්න. (ලකුණු 05 × 4 = 20 යි)

(i) යාවජ්ජමපි චෙ බාලෝ, පණ්ඩිතං පයිරුපාසති,
න සෝ ධම්මං විජානාති, දබ්බී සූපරසං යථා.

(ii) මුහුත්තමපි චෙ විඤ්ඤූ, පණ්ඩිතං පයිරුපාසති,
ඛිප්පං ධම්මං විජානාති, ජිව්හා සූපරසං යථා.

(iii) යං යං ජනපදං යාති, නිගමෙ රාජධානියො,
සබ්බත්ථ පූජිතො හොති, යො මිත්තානං න දූහති.

(iv) පූජකො ලභතෙ පූජං, වන්දකො පටිවන්දනං,
යසො කිත්තිං ච පප්පොති, යො මිත්තානං න දූහති.

[3 වැනි පිටුව බලන්න.

Scanned with CamScanner

9. පහත දැක්වෙන ගාථාවල සරල අදහස දක්වන්න. (ලකුණු 05 × 4 = 20 යි)

(i) මා මං අපාදකෝ හිංසි, මා මං හිංසි දිපාදකෝ,
මා මං චතුප්පදෝ හිංසි, මා මං හිංසි බහුප්පදෝ.

(ii) සබ්බේ සත්තා සබ්බේ පාණා, සබ්බේ භූතා ච කේවලා,
සබ්බේ භද්‍රානි පස්සන්තු, මා කඤ්චි පාපමාගමා.

(iii) අනුරාධපුරෙ රම්මෙ, වසන්තෝ සාසනං ඉමං,
ජොතයිස්සති යථා'සොක, ධම්මරාජාව සාසනං.

(iv) පිතා මේ පුරිසෝ හොති, නෙව වක්ඛති තෙනිදං,
පිළන්ධෙතූ'ති පෙසෙසි, ඉත්ථාලංකාරමස්ස සෝ.

10. පහත දැක්වෙන පාලි පාඨ සිංහලට නගන්න. (ලකුණු 04 × 5 = 20 යි)

(i) යදිදං චත්තාරි පුරිසයුගානි, අට්ඨපුරිසපුග්ගලා එස භගවතෝ සාවකසංඝෝ.

(ii) ඉධ භන්තෙ සාවත්ථියං අඤ්ඤතරෝ භික්ඛු අහිනා දට්ඨෝ කාලකතෝ.

(iii) රාජා තං සුත්වා හසි, ථෙරෝ කිමත්ථාය හසි මහාරාජා'ති ආහ.

(iv) තදා සෝ තස්ස මහාබුද්ධසීහනාදසුත්තෙන ධම්මං දෙසෙසි.

(v) පුත්ත, කිමත්ථං හත්ථපාදෙ පසාරෙත්වා සුඛෙන න නිපජ්ජසි?

* * *

PAST PAPERS WIKI

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library